# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2484/05 – 2026 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්දා – 2026.04.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදු කරන බලය පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර තිස්ස වර්ණසූරිය වන මම, වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක II දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

**තිස්ස වර්ණසූරිය,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2026 පෙබරවාරි මස 27 වන දින,
කුරුණෑගල දී ය.

උපලේඛනය

| I වෙනි තීරුව | II වෙනි තීරුව | III වෙනි තීරුව |
|---|---|---|
| කොන්තිගොඩ කංකානම්ගේ ලසන්ති ගුණතිලක | 2025.10.21 | සමුපකාර සමිති පනතේ 3, 5, 6. 7. 8,9,33, 39, 44 [44(6) හැර 45,46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58 (5)] හැර 59,68 සහ 72 යන වගන්තිය යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල සහ රීති මාලාවේ 4, 11, 15, 16(ii), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 48, 49[49(xii) හැර], 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියළු බලතල. |

EOG 04 - 0065


1A – PG7595 – 04 (2026/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*